සියලු ම හිමිකම් ඇවිරිණි.
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගැයීම
இரண்டாம் தவணை மதிப்பீடு - 2018
Second Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | විෂය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | පැය / மணித்தியாலம் / Hours |
|---|---|---|---|
| 10 | ඉස්ලාම් | I,II | 2 |

## කොටස - I

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. සුහුෆ් 30ක් පහළ වූ නබිවරයා,

   1. මූසා අලෛහිස්සලාම් 2. ආදම් අලෛහිස්සලාම්
   3. ෂීද් අලෛහිස්සලාම් 4. ඉද්රීස් අලෛහිස්සලාම්

2. මිනිසා යහමගට ඒමට අවශ්‍ය වැදගත්ම දෙය,

   1. රිසාලතය 2. ඥානය 3. ආදර්ශය 4. අධ්‍යාපනය

3. පංචකාල සලාතයේ ඇති රකාත් ගණන,

   1. 13 කි. 2. 17 කි. 3. 21 කි. 4. 5 කි.

4. මුඃමින්වරුන්ට වේලාව සඳහන් කර ඇති යුතුකම ලෙස කුර්ආන් පවසන්නේ,

   1. සකාතය 2. සලාතය 3. උපවාසය 4. හජ් ය.

5. රමලාන් මාසයේ දී පමණක් ඉටුකරනු ලබන සුන්නත් සලාතය,

   1. විත්ර් 2. ලුහා 3. තහජ්ජත් 4. තරාවීහ්

6. 'නින්දට වඩා සලාතය උතුම්' යන වැකිය හඳුන්වනු ලබන පදය වන්නේ,

   1. හයියඅලස්සලා 2. අස්සලාතු හයිරුන් මිනන්නව්ම්
   3. හයියඅල්ෆලා 4. අල්ලාහු අක්බර්

7. හයියඅලස්සලා යනු,

   1. ජයග්‍රහනය ලබා ගැනීමට පැමිණෙන්න. 2. සලාතය සඳහා පැමිණෙන්න.
   3. නින්දට වඩා සලාතය උතුම් 4. සියල්ල අල්ලාහ් සතුය.

8. ගින්නෙන් දර විනාශ වන්නාසේ යහපත් ක්‍රියා විනාශ කරන දෑ ලෙස නබිතුමා පවසන ලද්දේ,

   1. උඩඟුකම 2. ඊර්සියාව 3. භේද දුරැලීම 4. බොරුව

9. ''ජාමිඋල් කුර්ආන්'' ලෙස හඳුන්වනු ලබන්නේ,

   1. අලි (රලි) තුමා 2. උමර් (රලි) තුමා
   3. උස්මාන් (රලි) තුමා 4. අබූබක්කර් (රලි) තුමා

10. ''ෂෙයිකු'' යනු,

1. ගෝත්‍ර 2. කණ්ඩායම 3. සමාජය 4. පොකුර

11. ''කියාස්'' යනු,

1. සැසඳීම. 2. තීරණය කිරීම. 3. අනුමත කිරීම. 4. වෙන් කිරීම.

12. ''වරද'' යනු,

1. පිළිවෙත් සුරැකීම. 2. දයාව පෙන්වීම. 3. වෙන් කිරීම. 4. එකතු කිරීම.

13. ''නෆ්සුල් අම්මාරා බිස්සුඃ'' යනු,

1. තමා රිදවා ගන්නා සිත
2. තෘප්තිමත් සිත
3. අයහපතට පොළඹවන සිත
4. පිළිවෙලට ක්‍රියා කරන සිත.

14. ''මුර්තද්'' යන්නෙහි තේරුම,

1. වංචනිකයා
2. ප්‍රතික්ෂේප කරන්නා
3. ආදේශ කරන්නා
4. ඉස්ලාමය හැර ගිය තැනැත්තා

15. මහා පාප කර්ම යන අර්ථය දෙන අරාබි පදය,

1. කෆ්ෆාරා 2. ෂිර්ක් 3. කබායිර් 4. නිෆාක්

16. අනිවාර්ය ස්නානය සඳහා ලබාගන්නා ජලය,

1. මාඋන් මුස්තඃමල් 2. මාඋන් කලීල් 3. මාඋන් මුත්ලක් 4. මාඋන් නජීස්

17. ''අස්තඃෆිරුල්ලාහ්'' යන්නෙහි තේරුම,

1. අල්ලාහ්ට අවනත වීම.
2. අල්ලාහ්ගෙන් සමාව අයදීම.
3. ගස්වැල් ආරක්ෂා කිරීම.
4. අල්ලාහ් පරිශුද්ධත්වයට පත්කිරීම.

18. ජමාත් සමග අනිවාර්යයෙන්ම ඉටුකළ යුතු සලාතය,

1. තරාවීහ් 2. අවුරුදු උත්සවය 3. ජුම්ආ 4. ජනාසා

19. මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට ප්‍රථම වහීය පහළ වූ ස්ථානය,

1. කෘබාව 2. හිරා ගුහාව 3. මස්ජිදුන් නබවිය 4. තෞර් ගුහාව

20. මිනිසුන් අතර සුවිශේෂවූ තැනැත්තා වශයෙන් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම්තුමාගේ ප්‍රශංසාවට ලක් වූයේ,

1. මිනිසුන්ට ප්‍රයෝජනවත් සේවයක් කළ තැනැත්තා.
2. මිනිසුන්ට දන්දෙන තැනැත්තා.
3. සරල ජීවිතයක් ගත කරන තැනැත්තා.
4. වැඩියෙන් හජ් ඉටු කළ තැනැත්තා.

21. සලාතයේ අනිවාර්යයෙන් උසුරිය යුතු වන්නේ,

1. ෆාතිහා සූරත ය. 2. කුනූත ය. 3. වජ්ජහත් ය. 4. තස්බීහ් ය.

22. රුකූඋ, සුජූද් නොමැති සලාතය,

1. ග්‍රහණ සලාතය 2. ඊද් සලාතය 3. ජනාසා සලාතය 4. ලුහා සලාතය

23. විසඳුමක් නොමැති ප්‍රශ්නයකට කුර්ආන් හා හදීස් පදනමින් විසඳුම් දීම,

1. කරාමත් වේ. 2. ඉජ්තිහාද් වේ. 3. උර්ෆු වේ. 4. ඉල්ලත් වේ.

24. ''කුල්ලතෙයින් ජලය'' යනු,

1. ලීටර් 310 ට වැඩි
2. ලීටර් 260 ට වැඩි
3. ලීටර් 210 ට වැඩි
4. ලීටර් 360 ට වැඩි

25. 'මරණින් පසු ජීවිතය ගැන විශ්වාස කිරීම' ඊමනයේ,

1. පස්වෙනි කරුණු 2. හයවෙනි කරුණු 3. හතරවෙනි කරුණු 4. තුන්වන කරුණු

26. ජුම්ආ වේලාවේ දී වෙළඳාමේ යෙදීම,

1. හරාම් 2. මුබාහ් 3. මක්රූහ් 4. ජායිස්

27. වුළූඃ ඉටු කිරීමට නොහැකිව සිටින්නන්,

1. තයම්මුම් කළ යුතුය.
2. ස්නානය කළ යුතුය.
3. සලාතය අතපසු කළ යුතුය.
4. සලාතය ජම්උ කළ යුතුය.

28. මුස්ලිම්වරයකු තම දෙමාපියන් නිසි ආකාරයෙන් රැක බලා ගැනීම,

1. ෆර්ලු අයින් 2. ෆර්ලු කිෆායා 3. ජායිස් 4. සුන්නත්

29. සලාතයේ ෆර්ල් සංඛ්‍යාව,

1. 10 කි. 2. 19 කි. 3. 17 කි. 4. 20 කි.

30. ජල වර්ග ''තාහිර්'' යනු,

1. භාවිතා කළ ජලය 2. ඉතා පිරිසිදු ජලය 3. අපිරිසිදු ජලය 4. පිරිසිදු ජලය

31. යහපත් අකීදාව පිළි පදින්නන්,

1. සුන්නිවරු
2. ජබ්රියාවරු
3. ෂියාවරු
4. අහ්ලුස් සුන්නත් වල් ජමාඅත්

32. ශ්‍රී ලංකාවේ ඉස්ලාමය ව්‍යාප්ත වුයේ,

1. සහාබිවරු මාර්ගයෙන්
2. තාබියීන්වරු මාර්ගයෙන්
3. සුන්නිවරු මාර්ගයෙන්
4. වෙළෙඳුන් මාර්ගයෙන්

33. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා තම කුළුදුල් දේශනය සිදු කළ ස්ථානය,

1. අරෆා පිට්ටනිය 2. සෆා කන්ද 3. හිරා ගුහාව 4. කෑබතුල්ලාව

34. 'අල් වදූද්' යනු අල්ලාහ්ගේ අලංකාර නාමයේ අර්ථය වන්නේ,

1. දයාවන්තයා 2. මහඟු කරුණාවන්තයා

3. ශාන්ති වන්තයා 4. ඉවසීම් වන්තයා

35. සුජූද් කිරීමේ දී පොළොවෙහි ස්පර්ශවන අවයව ගණන,

1. 7 කි. 2. 5 කි. 3. 9 කි. 4. 3 කි.

36. ''වසීයත්'' යනු,

1. අන්තිම කැමැත්ත 2. ගනු දෙනුව 3. වෙළඳ ද්‍රව්‍ය 4. වගකීම

37. ප්‍රථම තක්බීරය,

1. තක්බීර් තහ්රීමා 2. වජ්ජහත්ය 3. දුආඋල් ඉප්තිතාහ් 4. ඉෑතිදාල්

38. 'සබූර්' ආගම පහළ වුයේ,

1. ඊසා අලෛහිස්සලාම්

2. මූසා අලෛහිස්සලාම්

3. දාවුද් අලෛහිස්සලාම්

4. මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට

39. ''අර් රූහානියාත්'' වලට උදාහරණය වන්නේ,

1. ආගම විශ්වාස කිරීම. 2. මලායිකාවරු විශ්වාස කිරීම.

3. කබ්ර් ජීවිතය පිළිබඳ විශ්වාසය කිරීම. 4. කලා කද්ර් පිළිබඳව විශ්වාසය කිරීම.

40. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාට ප්‍රථම වහී පහළ වූ විට එතුමා නබි යැයි ප්‍රථමයෙන් ස්ථිර කරන ලද්දේ,

1. අබුබක්කර් රලියල්ලාහු අන්හු 2. කදීජා රලියල්ලාහු අන්හා

3. වරකාබින් නව්ෆල් 4. අබූ තාලිබ්

***

# කොටස - II

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ඕනෑම ප්‍රශ්න හතරක් තෝරා ප්‍රශ්න පහකට උත්තර ලියන්න.**
- **පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් ද අනෙක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද වේ.**

**(01) කෙටි පිළිතුරු සපයන්න.**

1. මුහම්මද් නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමාණන්ව මක්කා වාසීන් විසින් අමතන ලද නම් 2 ක් සඳහන් කරන්න.
2. 'ඉඛ්ලාස්' යන වචනය අර්ථ දක්වන්න.
3. 'දාරුල් ෆනා', 'දාරුල් බකා' යන වචනවල තේරුම ලියන්න.
4. 'වහී ගෛරු මත්ලූව්' යනු කුමක් ද?
5. 'තර්තීබුන් නුසූල්' යන්න පැහැදිලි කරන්න.
6. අල් කුර්ආනය ගොනු කිරීම සිදුවුයේ කුමන කලීෆා වරයාගේ කාලයේදී ද?
7. 'ඉජ්මාඋස් සුකූති' යන්න පැහැදිලි කරන්න.
8. ජාහිලියා කාලය ගැන කෙටි හැඳින්වීමක් කරන්න.
9. 'සීරා' යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
10. වහී සටහන් කරන්නන් සඳහා භාවිතා වන නම ලියන්න.

**(02)** 1. ඉස්ලාම් පවසන යහ ගුණාංගයන් 03ක් සඳහන් කරන්න.

2. දෙමාපියන් කෙරෙහි දරුවන් දයාව දැක්විය යුතු ආකාරය පැහැදිලි කරන්න.

3. දන් දීමෙන් ඇති ප්‍රයෝජන මොනවා ද?

**(03)** 1. 'සුහුද්' යනු කුමක් ද?.

2. තව්බා පිළිගැනීමට අවශ්‍ය කොන්දේසි **03ක්** ලියන්න.

3. වහී පහළ වූ ක්‍රම මොනවා ද?

**(04)** 1. උස්මාන් (රලි) තුමා හට 'ජාමිඋල් කුර්ආන්' යනුවෙන් හැඳින්වීමට හේතුව කුමක් ද?

2. අබූබක්කර් රලියල්ලාහු අන්හු තුමාගේ කාලයේ අල් කුර්ආනය ගොනු කිරීමට හේතුවූ කරුණු සඳහන් කරන්න.

3. අල් කුර්ආනය ගොනු කිරීම සඳහා සයිද් ඉබ්නු සාබිත් රලියල්ලාහු අන්හු තුමාගේ දායකත්වය විස්තර කරන්න.

**(05)** 1. සුන්නාහ් අනුගමන කිරීම නිසා ඇතිවන ප්‍රයෝජන නම් කරන්න.

2. සුන්නාහ් ව ආරක්ෂා කර ගැනීමට විද්වතුන් අනුගමනය කළ ක්‍රියාවන් මොනවා ද?

3. ඉජ්මාව පිළිගෙන ඒ මග ගමන් කරන්නන්ට සිදුවන යහපත කුමක් ද?

**(06)** 1. ඉජ්මාවේ ප්‍රයෝජන **2ක්** සඳහන් කරන්න.

2. උපකාරක මූලාශ්‍ර නම් කරන්න.

3. කියාස් හි කොටස් කෙටියෙන් හඳුන්වන්න.

**(07)** 1. අර්කම් රලියල්ලාහු අන්හුතුමාගේ නිවස වැදගත් වන්නේ ඇයි?

2. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා සහ හාෂිම්වරු සමාජ විරෝධයට ලක්වීමට හේතු වූ කරුණු මොනවා ද?

3. නබි සල්ලල්ලාහු අලෛහිවසල්ලම් තුමා අභියෝග ජයගත්තේ කෙසේ ද?

**(08)** **පහත සඳහන් ඕනෑම මාතෘකා 02ක් යටතේ කෙටි සටහන් ලියන්න.**

1. විශ්වාසවත්ත බව.
2. දන්දීම.
3. සීරාවේ වැදගත් බව.

***